2024.12.09 දිවයින. පිටු 1, 2

# සංගණන නිලධාරීන්ට බය නැතිව තොරතුරු දෙන්න

ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්

>> 02 පිටුව

# සංගණන නිලධාරීන්ට බය නැතිව තොරතුරු දෙන්න

ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්

සංගණන කටයුතු සඳහා නිවාස වෙත පැමිණෙන ගණන් ගැනීමේ නිලධාරීන්ට අවශ්‍ය තොරතුරු ලබාදීමට කිසිදු බියක් ඇති කරගත යුතු නැතැයි බව ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් අනෝජා සෙනෙවිරත්න මහත්මිය මහජනතාවට දැනුම්දී සිටියි.

එම නිලධාරීන්ට ඇතැම් නිවාසවලින් තොරතුරු ලබානොදීමේ තත්ත්වයක් වාර්තා වී තිබීම සම්බන්ධයෙන් අදහස් දක්වමින් ඇය මේ බව සඳහන් කළාය.

එම සංගණන කටයුතු දෙසැම්බර් මස 23 වැනිදායින් අවසන් කිරීමට බලාපොරොත්තු වන බව සඳහන් කළ අධ්‍යක්ෂ ජනරාල්වරිය මෙම තොරතුරු රැස්කිරීම ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව විසින් සිදුකරනු ලබන්නේ සංගණන අඥා පනත යටතේ පැවැරී ඇති බලතල අනුව බවත් කිසිදු ආකාරයකින් පුද්ගලික මට්ටමේ තීන්දු තීරණ ගැනීමට මෙම තොරතුරු භාවිතා නොකරන බවද පැවසුවාය. රටේ ඉදිරි අනාගතයට, ඉදිරි වසර 10 සඳහා ජාතික ප්‍රතිපත්ති සම්පාදනයට, සැලසුම් සකස් කිරීමට අවශ්‍ය තොරතුරු මෙම සංගණනයෙන් ලබාදෙන බවත් මෙම ගණන් ගැනීමේ අදියරයේ කටයුතු දෙසැම්බර් 23 වැනිදායින් අවසන් කිරීමට කටයුතු සැලසුම් කරලා ඇති බවත් ඇය කීවාය. දෙසැම්බර් 19 දිනය සංගණන දියන විදිහට ප්‍රකාශයට පත්කරලා ගැසට් නිවේදනයක් ජනාධිපතිවරයා විසින් නිකුත්කරලා තියෙනවා.

ජන හා නිවාස සංගණනයේ තොරතුරු රැස්කිරීමේ අදියරයේ කටයුතු 2024 වසරේ ඔක්තෝබර් මාසයේ 07 වැනිදා ආරම්භ වුණා. 2023 වසරේ ඔක්තෝබර් මාසේ ආරම්භ කළා සෑම නිවසකට, ගොඩනැගිල්ලකටම රතු පාට ලේබලයක් අලවන්න. ඒ ලේබලය පදනම් කර ගනිමින් තමයි නිවාසවල ජීවත් වෙන පුද්ගලයන්ගේ සහ ඒ නිවාසවල තොරතුරු රැස්කිරීම අපි සිදුකළේ. ඒ සඳහා යම් නිවසකට අදාළ නිලධාරියෙක් නොපැමිණියහොත් 1901 දුරකථන අංකය අමතා දැනුම් දෙන ලෙසද ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් අනෝජා සෙනෙවිරත්න මහත්මිය වැඩිදුරටත් සඳහන් කළාය.